// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1721/9 – 2011 අගෝස්තු 29 වැනි සඳුදා – 2011.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩමේ පරවශතාව, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාවය අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 වැනි ඡේදයේ විස්තර වේ.

1\. නුවරඑළිය දිස්ත්‍රික්කයේ, සමූහ ජල සම්පාදන ව්‍යාපෘතියේ, ගිනිගත්හේන ජල සම්පාදන ක්‍රමයේ, ඇටලිස් ජල මූලාශ්‍රයේ සිට සම්ප්‍රේෂණ නල එළීම හා නඩත්තු කිරීම සඳහා ඉඩමේ පරවශතාවය අත්කර ගැනීම.

2\. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව කෝරලය සුළු කොට්ඨාසයේ, කැරොලිනා වත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක NU/AMB/2010/36 සහ 2010.05.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1332ක් පමණ වන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස් දෙකට (2) මායිම්:

01\. කැබලි අක්ෂර 'ඒ' – කැරොලිනාවත්ත – ප්‍රමාණය: **හෙක්. 0.0371ක් පමණ**

උතුරට: කැරොලිනා වත්ත, මාර්ගය (මා.සං.අ.) සහ කැරොලිනා වත්ත; නැගෙනහිරට: කැරොලිනා වත්ත; දකුණට: කැරොලිනා වත්ත, ඇළ, කැබලි අක්ෂර බී සහ කැරොලිනා වත්ත; බටහිරට: කැබලි අක්ෂර බී, ඇළ සහ කැරොලිනා වත්ත.

02\. කැබලි අක්ෂර 'සී' – කැරොලිනාවත්ත – ප්‍රමාණය: **හෙක්. 0.0961ක් පමණ**

උතුරට: කැරොලිනා වත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ කැරොලිනා වත්ත; දකුණට සහ බටහිරට: කැරොලිනා වත්ත සහ ඇළ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2008/WS/305.
2011 ජූනි මස 24 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 390